# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1717/7 – 2011 අගෝස්තු 02 වැනි අඟහරුවාදා – 2011.08.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/14/02/2007.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එච්. එන්. එච්. හෙන්නායක මිය, අංක 26/14, කුට්ටියගොල්ල පාර, හංවැල්ල, හිඳගොඩ, බදුල්ල.

සහ

ලංකා විදුලිබල මණ්ඩලය. අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

වත්තල. හැඳල, නිමල මරියා මාවත, නො. 33/2හි නීතිඥ පාලිත වීරසේකර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 ජූලි මස 27 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/14/02/2007.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එච්. එන්. එච්. හෙන්නායක මිය, අංක 26/14, කුට්ටියගොල්ල පාර, හංවැල්ල, හිඳගොඩ, බදුල්ල.

සහ

ලංකා විදුලිබල මණ්ඩලය. අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

01. ලංකා විදුලිබල මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඌව) කාර්යාලයේ සේවය කළ එච්. එන්. එච්. හෙන්නායක මහත්මිය යතුරු ලේඛක සේවයේ III වන පන්තියේ සිට II වන පන්තියේ 'අ' ඛණ්ඩයට උසස් කිරීම 1998.05.28 දින වශයෙන් එම මණ්ඩලය විසින් තීරණය කිරීම නිසාවෙන් යම් අසාධාරණයක් සිදුව ඇද්ද, සිදුව ඇතොත් ඇයට හිමි සහන මොනවාද,

02. එච්. එන්. එච්. හෙන්නායක මහත්මිය විසින් 1996.06.25 දින සිදු කරනු ලදැයි දක්වන වරදකට දඬුවම් පමුණුවීම 2002.02.28 දින දක්වා ප්‍රමාද කිරීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් වූයේද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඇයට කුමන සහනයක් හිමිවිය යුතුද,

03. එච්. එන්. එච්. හෙන්නායක මහත්මියට 2002.01.01 දින සිට ලංකා විදුලිබල මණ්ඩලයේ වෛද්‍යාධාර යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභයන් අවුරුදු පහ (05) ක කාලයක් සඳහා අත්හිටුවීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් වූයේද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඇයට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න හා,

04. එච්. එන්. එච්. හෙන්නායක මහත්මිය වයස අවුරුදු හතලිස් පහ (45) සම්පූර්ණ වීම මත යතුරු ලේඛක සේවයේ II "ආ" ඛණ්ඩයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කිරීමෙහි පිළිවෙත (චක්‍රලේඛය) ඇයට ක්‍රියාත්මක කළයුතුව තිබුනේද, එසේ වූයේ නම් ඇයට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2011 ජූනි මස 24 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

08 - 423

---

මගේ අංකය: IR/10/32/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

ෂර්ලි ද සිල්වා මහතා, නො. 21/4 ලුවිස් සේනාරත්න පෙදෙස, උපනන්ද මාවත, අත්තිඩිය. දෙහිවල

සහ

ඩයනග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්. අංක 549 බි, ඉසුරු උයන, තලංගම දකුණ, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා ඇමති ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා එකමුතු මාවත, අංක 570/බී/1 හි, පී. නවරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 ජූලි මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/32/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ෂර්ලි ද සිල්වා මහතා, නො. 21/4 ලුවිස් සේනාරත්න පෙදෙස, උපනන්ද මාවත, අත්තිඩිය. දෙහිවල

සහ

ඩයනග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්. අංක 549 බි, ඉසුරු උයන, තලංගම දකුණ, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

ඩයිනග්‍රෝ (ප්‍රයිවඩ්) ලිමිටඩ් ආයතනයේ මූල්‍ය පාලකවරයා ලෙස සේවය කළ ෂර්ලි ද සිල්වා මහතා සේවයෙන් ඉවත්ව යෑමට සැලැස්වීම යුක්ති සහගතද, ඉන්ධන දීමනාව, වාහන දීමනාව සහ නිවාඩු දීමනාව නොගවා හැරීම සාධාරණද යන්නත්, එසේ වන්නේ නම් කුමන සහනයක් කුමන ප්‍රමාණයකින් හිමිවිය යුතුද යන්නත් පිළිබඳව වේ.

**හේරත් යාපා,**
වැඩබලන කම්කරු කොමසාරිස්.

2011 ජුනි මස 14 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

08 - 424

---

මගේ අංකය: IR/22/70/2009

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

ඒ. එම්. ජේ. අතපත්තු මයා, වැව රවුම් පාර, කුඩාගල්ගමුව, කුරුණෑගල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා ඇමති ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බොරලැස්ගමුව, එගොඩවත්ත, පළමු පටුමග, අංක 213 හි නීතීඥ එස්. එම්. එස්. ජයවර්ධන මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 ජූලි මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/22/70/2009

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඒ. එම්. ජේ. අතපත්තු මයා, වැව රවුම් පාර, කුඩාගල්ගමුව, කුරුණෑගල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

එවකට සීමාසහිත වයඹ බස් සමාගමේ සේවය කළ ඒ. එම්. ජේ. අතපත්තු මහතා කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 63773/01 හා 2005.07.19 දිනැති නියෝගය අනුව ඔහු සියලු චෝදනා වලින් නිදහස් කිරීම මත 2002 ජුනි මස සිට 2003 ජුනි මස දක්වා වැටුප් රහිතව හා 2003 ජූලි මස සිට 2003 දෙසැම්බර් මස දක්වා අඩ වැටුප් සහිතව සිටි කාලසීමාවට හිඟ වැටුපක් සඳහා හිමිකම් ලබන්නේද යන්න හා හිමිකම් ලබන්නේ නම් ඔහුට කුමන ප්‍රමාණයක මුදලක් ලැබිය යුතුද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2011 ජුනි මස 24 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

08 - 425

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.